**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය සේවා ගණයේ දිස්ත්‍රික් පරීක්ෂක (ප්‍රවාහන හා වාණිජ) තනතුරට සීමිත පදනම මත උසස් කිරීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම - 2020 (2023)**

# Limited Competitive Examination for Recruitment to the Post of District Inspector (Transportation & Commercial) in Management Assistant Supra Grade Service category of Sri Lanka Railway Department 2020(2023)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.10.19 දිනැතිව අනුමත කරන ලද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය සඳහා වන බඳවා ගැනිමේ පරිපාටිය ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තියේ දිස්ත්‍රික් පරීක්ෂක (ප්‍රවාහන හා වාණිජ) තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2023.08.10 දින වේ.

1). මෙම සීමිත තරඟ විභාගය මඟින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය සේවා ගණයේ දිස්ත්‍රික් පරීක්ෂක (ප්‍රවාහන හා වාණිජ) තනතුර සඳහා වේ.

2). **සුදුසුකම්**

2.1 පළපුරුද්ද

a. දුම්රිය ස්ථානාධිපති/ දුම්රිය නියාමක විශේෂ ශ්‍රේණියේ තනතුරක නිලධාරියෙකු වීම සහ පූර්වාසන්න වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

b. දුම්රිය ස්ථානාධිපති /දුම්රිය නියාමක 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම සහ පූර්වාසන්න වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.2 කායික සුදුසුකම්

I. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.3 වෙනත් සුදුසුකම්

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.
iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

3). පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව 22 කි. එම පුරප්පාඩුව සඳහා සම ලකුණු ලබා අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය වේ.

4). සේවා කොන්දේසි

4.1 රාජ්‍ය සේවයේ පත්වීම පාලනය කෙරෙන පොදු කොන්දේසීවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/04-01-43/06/2016 හා 2018.10.09 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධිපන්තිය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම පරිපාටියට කර ඇති හෝ මින්මතු කරන සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 1589/30 කරන හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද යටත් වේ.

4.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය.

4.4 තමන් වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5). මාසික වැටුප් පරිමාණය
2016.02.25 දිනැති 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.41,580/- 11 X 755 – 18 X 1,030 - රු.68,425/- (MN-07-2016) වේ. එහි 04 වන පියවරෙහි එනම් රු. 43,845/-ආරම්භක වැටුප් තලයෙහි පිහිටවනු ලැබේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උප ලේඛනයේ II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

6). විභාග ගාස්තුව
මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පවත්වනු ලැබේ. විභාග ගාස්තුව රු.1500/- කි. විභාග ගාස්තුව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ ආදායම් ශීර්ෂ 306-2-1-0-1409-00-001 ට බැර වන ලෙස අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

i. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

ii. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

07. **<u>අයදුම් කිරීමේ ක්‍රමය</u>**

**(අ)** අයදුම්පත මෙම නිවේදනයේ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එය කඩදාසිය දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සෙ.මී.29.5 X 21 ප්‍රමාණයේ A 4 කඩදාසියක සකස් කර තම අත් අකුරින් ම පිරවිය යුතු ය. අංක 01 සිට 2.8 තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද වන ලෙස ගෙන අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම්පත යොමු කිරීමට පෙර එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කර ලදුපත අලවා ඇති බවටත් නැවත විමසිලිමත් විය යුතුය.

**(ආ)** අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව, ඉංග්‍රිසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

**(ඇ)** අපේක්ෂකයන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ද සමඟ තම උප දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් උප දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ලබා ගැනිමෙන් පසු ඡායා පිටපත පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කර එහි මුල් පිටපත දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේ පත්වීම් ශාඛාව වෙත 2023.08.10 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය

උප දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවනු ලබන අයදුම්පතට අමතරව වෙනත් කිසිදු අයදුම්පත් පිටපතක් පෞද්ගලිකව එවීම නොකළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. උප දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සෑම අයදුම්පතක්ම සෑම අයුරකින්ම සම්පූර්ණ බව තහවුරු කළ යුතු අතර, ආදර්ශ අයදුම්පතේ අංක 7 න් දැක්වෙන ආයතන ප්‍රධානියාගේ සහතිකය ද අත්සන් කළ යුතු ය. අයදුම්පත දුම්රිය සාමාන්‍යාධිකාරිගේ හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තිය සේවා ගණයේ දිස්ත්‍රික් පරීක්ෂක (ප්‍රවාහන හා වාණිජ) තනතුරට සීමිත පදනම මත උසස් කිරීමේ තරග විභාගය 2020(2023) "** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය විභාගය සම්බන්ධයෙන් සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සිදු වන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

(ඇ) අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේ පත්වීම් ශාඛාව විසින් අදාළ කැබිනට් ශාඛාව වෙත දැනුම් දෙනු ලැබේ. එම දැනුම් දිමෙන් පසු දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දුරකථන අංක 011-5980236 මඟින් විමසීම කළ හැක. එසේ විමසීමේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන

ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

**8)** විභාගයට ඇතුළුවීම

**(අ)** ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. අයදුම්කරු තම අයදුම්පත්‍රයේ සඳහන් කළ ජාතික හැඳුනුම්පත් අංකයම විභාග ශාලාවේදී ද යෙදිය යුතු වන අතර, යම් හෙයකින් වෙනත් අංකයක් ඇතුළත් කර තිබුණහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අත්හිටවනු ලැබේ. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

(ඇ) අත්සන සහතික කිරීම

අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරනු ලද නිලධාරියකු ලවා සහතික කරගත යුතුය.

**සටහන :-** අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9) අයදුම්කරුගේ අනන්‍යතාව

අපේක්ෂකයන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයය සඳහා විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**10)** **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම**

i. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර හෝ අවස්ථාවක දී වුව ද ඇයගේ හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

ii. අපේක්ෂකයකු විසින් සපයනු ලබන තොරතුරු පසු කලෙක දී වැරදි බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු හෝ ඇය වෙත පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් තව දුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොටගෙන දී තිබු පත්වීමක් අහෝසි කිරිමට හෝ රජයේ සේවයෙන් පහ කිරිමට වුව ද යටත් වේ.

**11)** විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය

**මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය නියම කරන දිනක දී කොළඹ දී පමණක් පැවැත්වේ.**

11.1 විභාග මාධ්‍යය -

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

<u>සටහන</u>

a. අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
b. තම අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

11.2 විභාග ප්‍රතිඵල

I. මෙම විභාගයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කිරිමට කටයුතු කරනු ලබන අතර සියළුම බඳවා ගැනිම් නිම කිරිමෙන් අනතුරුව දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් අනෙකුත් අයදුම්කරුවන්ගේ ලකුණු නිකුත් කරන ලෙස දැන් වූ පසු විභාගයට පෙනි සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවිමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් කටයුතු කරනු ඇත.

II. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරිම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

11.3 විභාගයේ විෂය නිර්දේශය

11.3.1 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය

I. බුද්ධි පරීක්ෂණය

මෙය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. සංඛ්‍යාමය ගැටලු, වගු, ගැලපීම් සටහන්, ප්‍රස්තාර/පින්තූර උපයෝගී කර ගනිමින් බහුවරණ ක්‍රමයට මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ. මෙමගින් අපෙක්ෂකයාගේ තර්කානුකූල විචාර බුද්ධිය. විඥාන ශක්තිය, ක්ෂණිකව නිවැරදි තීරණ ගැනිමේ හැකියාව මැන බැලිම අපේක්ෂා කෙරේ.

II. අවබෝධය

අපේක්ෂකයාගේ අදහස් ගොනුකර, නිරවුල්ව ප්‍රකාශ කිරීමේ හැකියාව, නිවැරදි භාෂා ව්‍යවහාරය, වාර්තා ලිවීමේ හැකියාව, අවබෝධ කර ගැනීමේ ශක්තිය මැනිය හැකි පරිදි වාක්‍ය රචනයක්, අවබෝධ පාඨයක්, ඇතුළු ප්‍රශ්න ඇතුළත් කර සකසනු ලබන ප්‍රශ්න පත්‍රයකි.

**12)** බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත තරඟ විභාගයෙන් සමත් වන අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ලිඛිත පරීක්ෂණයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතාව මත වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙලට අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

12.1 ලිඛිත විභාගය

පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙකකින් (02 කින්) යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයන් හා එක් එක් විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| විෂයය | කාලය | ලකුණු ප්‍රමාණය | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01.බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02.අවබෝධය | පැය 02 | 100 | 40% |

අයදුම්කරුවන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

12.2 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

මෙම නිවේදනයේ 12.1 ඡේදය අනුව ලිඛිත තරඟ විභාගයට පෙනී සිට සමත් වූ අයදුම්කරුවන්ගෙන් කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන සංඛ්‍යාවක් තෝරා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ඇත. ලිඛිත හා යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවල එකතුව පදනම් කර කුසලතා අනුපිළිවෙළට අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ අතිරේක සුදුසුකම් මැන බැලීම සඳහා පහත සඳහන් විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු සීයයකි. (100කි).

12.3 විස්තරාත්මක ලකුණු පරිපාටිය

සැ.යු :- සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

<table>
<tr><th>අනු අංකය</th><th>ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර</th><th colspan="2">සලකා බලන උප ක්ෂේත්‍රයන්</th><th>ලබා දෙන ලකුණු ප්‍රමාණය</th><th>උපරිම ලකුණු ප්‍රමාණ ය</th></tr>
<tr><td>1.</td><td>අධ්‍යාපන සුදුසුකම්</td><td colspan="2">ඕනෑම විෂය ක්ෂේත්‍රයක රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයක් මඟින් ලබා ගත් උපාධියක්</td><td>20</td><td>20</td></tr>
<tr><td rowspan="2">2.</td><td rowspan="2">වෘත්තීය සුදුසුකම්</td><td colspan="2">අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක් හෝ ඊට වැඩි පාඨමාලාවක් සඳහා</td><td>20</td><td rowspan="2">20</td></tr>
<tr><td colspan="2">අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ට අඩු පාඨමාලා සඳහා</td><td>10</td></tr>
<tr><td rowspan="6">3.</td><td rowspan="6">අතිරේක පළපුරුද්ද</td><td rowspan="3">දුම්රිය ස්ථානාධිපති සේවය</td><td>කොට්ඨාශ තුනේමදුම්රිය ස්ථානාධිපති 111, 11 හා 1 වශයෙන් මෙහෙයුම් දුම්රිය ස්ථානාධිපති වශයෙන් සේවයේ යෙදී තිබීම</td><td>06</td><td rowspan="6">30</td></tr>
<tr><td>දුම්රිය ස්ථානාධිපති 1 ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව සතුටුදායක සේවා කාලය සඳහා වසරකට ලකුණු 02 බැගින්</td><td>12</td></tr>
<tr><td>දුම්රිය ස්ථානාධිපති විශේෂ ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව සතුටුදායක සේවා කාලය සඳහා වසරකට ලකුණු 03 බැගින්</td><td>12</td></tr>
<tr><td rowspan="3">දුම්රිය නියාමක සේවය</td><td>කොට්ඨාශ තුනේම දුම්රිය නියාමක 111, 11 හා 1 වශයෙන් සේවයේ යෙදී තිබීම</td><td>06</td></tr>
<tr><td>දුම්රිය නියාමක 1 තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව සතුටුදායක සේවා කාලය සඳහා වසරකට ලකුණු 02 බැගින්</td><td>12</td></tr>
<tr><td>දුම්රිය නියාමක විශේෂ පන්තියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව සතුටුදායක සේවා කාලය සඳහා වසරකට ලකුණු 03 බැගින්</td><td>12</td></tr>
<tr><td rowspan="2">4.</td><td rowspan="2">ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව</td><td colspan="2">පිළිගත් ආයතනයකින් ලබා ගත් ඩිප්ලෝමා - මාස 06 කට වැඩි</td><td>10</td><td rowspan="2">15</td></tr>
<tr><td colspan="2">පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික පත්‍ර පාඨමාලා - මාස 03 සිට 06 දක්වා</td><td>05</td></tr>
<tr><td rowspan="2">5.</td><td rowspan="2">පරිගණක හැකියාව</td><td colspan="2">පිළිගත් ආයතනයකින් ලබා ගත් ඩිප්ලෝමා - මාස 06 කට වැඩි</td><td>06</td><td rowspan="2">10</td></tr>
<tr><td colspan="2">පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික පත්‍ර පාඨමාලා - මාස 03 සිට 06 දක්වා</td><td>04</td></tr>
<tr><td></td><td colspan="3">(සැ.යු. - අංක 4 සහ 5 අනු කොටස් සඳහා ඩිප්ලෝමා පාඨමාලාවක් මාස 06 කට නොඅඩු හෝ පැය 720 ට නොඅඩු හෝ විය යුතු අතර, සහතික පත්‍ර මාස 03 කට නොඅඩු හෝ පැය 360 ට නොඅඩු හෝ විය යුතු ය. සියලු පාඨමාලා රජය විසින් පිළිගත් ආයතනයක් මඟින් පැවැත් වූ පාඨමාලා විය යුතුය.)</td><td></td><td></td></tr>
<tr><td rowspan="3">6.</td><td rowspan="3">සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාව</td><td colspan="2">නායකත්වය</td><td>02</td><td rowspan="3">05</td></tr>
<tr><td colspan="2">පෞරුෂය</td><td>02</td></tr>
<tr><td colspan="2">සන්නිවේදන කුසලතාව</td><td>01</td></tr>
</table>

12.4 පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් වූ අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රමුඛතා ලේඛනයක් (විභාග අංක පිළිවෙළට/ අකාරාදි පිළිවෙළට සකස් කළ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත.)

**13).** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**14).** කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
07 වෙනි මහල, සෙත්සිරිපාය,
II අදියර,
බත්තරමුල්ල.
............................. දින.

**ඇමුණුම II**
**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර අධි පන්තියේ දිස්ත්‍රික් පරීක්ෂක (ප්‍රවාහන හා වාණිජ) තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020 (2023)**

**Limited Competitive Examination for Recruitment to the Post of District Inspector (Transportation & Commercial) Management Assistant Supra Grade Service of Sri Lanka Railway Department 2020(2023)**

1. මාධ්‍යය:

   විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය: [ ]
   සිංහල - 2
   දෙමළ - 3
   ඉංග්‍රීසි - 4

   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
   අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2. පෞද්ගලික තොරතුරු:

   2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................
   ........................................................................................................................
   (උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDANE)

   2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම:
   ........................................................................................................................
   (උදා : GUNAWARDANE , H.M.S.K) :

   2.3 සම්පූර්ණ නම: (සිංහලෙන් / දෙමළෙන්): ……………………………………………
   ……………………………………………………………………………………………

   2.4. කාර්යාලීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...........................................................
   ........................................................................................................................
   (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :

   2.5. කාර්යාලීය ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :...........................................................
   ........................................................................................................................

   2.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :...........................................................
   ........................................................................................................................

   2.7 ස්ත්‍රී / පුරුෂ භාවය : අදාළ අංකය කොටුව තුළ ලියන්න [ ]
   පුරුෂ - 0
   ස්ත්‍රී - 1

   2.8 ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.9 ජංගම දුරකථන අංකය: | | | | | | | | | | |

2.10 විවාහක / අවිවාහක බව : අදාළ අංකය කොටුව තුළ ලියන්න
විවාහක - 1
අවිවාහක - 2

2.11 ජන වර්ගය : අදාළ අංකය කොටුව තුළ ලියන්න

| | | | | | |
|---|---|---|---|---|---|
| සිංහල | - | 1 | මුස්ලිම් - | 4 |
| දෙමළ | - | 2 | වෙනත් - | 5 |
| ඉන්දියන් දෙමළ | - | 3 | | |

2.12 උපන් දිනය :
වර්ෂය මාසය දිනය

3 ඔබ............. දිනට වූ ……………..සේවයට/ ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/ සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න :...........................................................

4 ඉල්ලුම් කිරීම සඳහා සියලු සුදුසුකම් සපුරා තිබේ ද? :(ගැසට් නිවේදනයේ 02. වන ඡේදය ප්‍රකාරව) ..........................................

I. අයත් වන සේවය : දුම්රිය ස්ථානාධිපති/දුම්රිය නියාමක සේවය
(අදාළ නොවන වචනය කපා හරින්න)

II. ............................................දිනට වයස

III. දැනට දරන තනතුර :.........................................................................................

IV. ශ්‍රේණිය :.........................................................................................

V. තනතුරට පත් වූ දිනය:.........................................................................................

VI. එම තනතුරේ ස්ථිර කරන ලද දිනය :.........................................................................

VII. වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය:.............................................................

VIII. විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :...............................................................

IX. ගැසට් නිවේදනයේ 02. වැනි ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සේවයේ නියුතු සේවාවේ / ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු ................................. දිනට සක්‍රිය හා සතුටුදායක මුළු සේවා කාලය :............................................................

5. විභාග ගාස්තු ගෙවීම :

I. ගෙවන ලද කාර්යාලය : ......................................................................

II. ගෙවූ මුදල : ......................................................................

III. ගෙවූ දිනය : ......................................................................

IV. ලදුපත් අංකය : ......................................................................

ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

6. අයදුම්කරුගේ සහතිකය :

............................... දිනට පූර්වාසන්න වසර 05 තුළ (සේවා හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, ගැසට් නිවේදනයේ 2:1 ඡේදයට අනුව ..................................................දිනට සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

ගැසට් නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පරිපාටිය අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

...................................................... ................................................

දිනය. අයදුම්කරුගේ අත්සන

7. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය: (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ මයා/මිය ……………………….තනතුරක සේවය කරන බවද .......................... දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණ සමත් වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද එම කාල සීමාව තුළ කළ වරදකට/(අවවාද කිරීම හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද,ගැසට් නිවේදනයෙහි 2:1 ඡේදයට අනුව සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද අදාළ ගැසට් නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත අත්සන් කළ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද මෙයින් සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ /බලයලත් නිලධාරියාගේ අත්සන :-...................................................

නම :- ......................................................................................................

පදවි නාමය :- ......................................................................................................

දිනය :- ......................................................................................................
(නිල මුද්‍රාව යොදන්න)